# ඕවාගිරිය පැරණි ආරාම සංකීර්ණය

ඉන්දික ගුණවර්ධන[1]

සාම්ප්‍රදායික ඉතිහාස කථනයට අනුව රෝහණයේ ඉතිහාසය දෙවනපෑතිස් සොයුරු මහානාගගෙන් ආරම්භ වේ. ඉන් මොබ මහාවංසය ප්‍රමුඛ සාහිත්‍යික වාර්තා රජරට ඉතිහාසය විග්‍රහ කිරීම සඳහා දරණ ප්‍රයත්නයට සාපේක්ෂව රෝහණ දේශයේ ක්‍රියාකාරිත්වය රචනයට දක්වා ඇත්තේ අවම අවධානයකි. මේ හේතුව නිසා රජරට අතීතයට පිවිසෙන තරම් පහසුවෙන් රුහුණේ යටගියාව හාරාඇවිස්සීම පහසු කටයුත්තක් නොවේ. ඒ ද හැරුණුවිට රෝහණය කේන්ද්‍රකොටගත් පුරාවිද්‍යාත්මක අධ්‍යයනයන්ගේ ප්‍රාමාණික හිඟතාව ද මෙහිලා මහත් බලපෑමක් සිදුකොට තිබේ.

ඒ කෙසේ වෙතත් රෝහණය වූ කලී අතීත ශ්‍රී ලාංකේය සංස්කෘතික, දේශපාලන, ආර්ථික ආදී සියලු ක්ෂේත්‍රයන්හි අනවරත මෙහෙවරකට දායකත්වය සැපයූ ජනතාවකගේ ජන්ම භූමිය වූ බවට සැක නැත. ලාංකේය දේශපාලන ක්‍රියාවලිය තුළ තීරණාත්මක කාර්යභාරයකට දායකත්වය සැපයූ රෝහණ ජනයාගේ ආගමික මනෝ භාවයන් හා ඊට අදාල කලාත්මක ප්‍රකාශන අද අපට හඳුනාගැනීමට සිදුව ඇත්තේ උක්ත ප්‍රදේශය පුරා විසිර පවත්නා නටබුන් ස්මාරක අධ්‍යයනය කිරීම තුලිනි.

ඉඟිනියාගල අම්පාර මාර්ගයේ ඉඟිනියාගල සිට කි.මී. 15 ක් පමණ අම්පාර දෙසට ගමන් කිරිමේදී ප්‍රධාන මාර්ගයේ දකුණු දිශාවෙන් පිහිටා ඇති ඕවාගිරිය ඉපැරණි ආරාම සංකීර්ණය ද රෝහණ වංශ කථාවට එක්වූ තවත් එක් පරිච්ඡේදයකි. එහි විසිරියා වූ ස්තුප, ප්‍රතිමාගෘහ යනාදි හඳුනාගත් සහ මෙතෙක් හඳුනා නොගත් ස්මාරක අතීතයේ එක්තරා කාල සමයක ප්‍රාදේශීය වශයෙන් පැවති ආගමික සෞභාග්‍යයේ පැතිකඩක් නිරූපණය කරයි. මේ ආරාම භූමියේ නිර්මාණාත්මක ඉතිහාසය විමසා බැලීම තවමත් විශාල ගැටළුවක්ව පවතී. ඊට ප්‍රධාන හේතුව වී ඇත්තේ තත් ප්‍රදේශය මුල් කොටගෙන ප්‍රමාණවත් පුරාවිද්‍යාත්මක අධ්‍යයන ක්‍රියාත්මක කර නොතිබීමත් ස්ථානීය පැරණි නාමය හඳුනාගැනීමට අපොහොසත් වීමත් ය. ජනශ්‍රැතියට අනුව මේ ස්ථානයේ

[1] පුරාවිද්‍යා පර්යේෂණ සහකාර, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ 07.
ඊමේල්: archigeeindu@yahoo.com

ඉතිහාසය කාවන්තිස්ස රාජ සමය දක්වා අතීතයට ගමන් කරයි. රාජ්‍යත්වය මුල්කොටගෙන ගැමුණු සහ තිස්ස කුමරුන් දෙපළ අතර යුද්ධ ඇතිවේ. මේ යුද්ධ නිමා කිරිමේ අරමුණින් කුමරුන් දෙපළ කැඳවා අවවාද දුන් ස්ථානය මෙය බව ජනප්‍රවාදගත පිළිගැනීමයි. මේ නිසාවෙන් ඔවාගිරිය යන නාමය මීට පටබැඳී තිබේ.

නමුත් කුමරුන් දෙපළට මහා සංඝරත්නය විසින් අවවාද දුන් අවස්ථාව වංශකථාව විග්‍රහ කරන්නේ මීට වඩා වෙනස් ආකාරයකටවීම ගැටළු මතුකරවයි. එහි මෙවැනි විහාරස්ථානයක් පිළිබඳ වාර්තා නොවේ. එසේම කාවන්තිස්සයන්ගේ විහාර කර්මාන්ත අතරට ඔවාගිරිය නමින් විහාරයක් පිළිබඳව ද සඳහන් නොවේ. ඒ නිසා ජනප්‍රවාදගත තොරතුරු සත්‍ය සේ සැලකීම කළ නොහැක්කක් බවට පත්ව තිබේ. ඒ කෙසේ වෙතත් වඩාත් පුළුල් සහ විද්‍යානුකුල පුරාවිද්‍යාත්මක අධ්‍යයන සහ ශාස්ත්‍රීය පදනමක පිහිටා කරනු ලබන ඉතිහාස අධ්‍යයනයන් තුළින් මේ ආරාම පරිශ්‍රයේ ඓතිහාසික පසුබිම සත්‍ය තොරතුරු මත පිහිටා ගොඩනැංවීමට හැකිවනු ඇත.

**ප්‍රමුඛ පදඃ** ඕවාගිරිය, රජරට ඉතිහාසය, රෝහණ ඉතිහාසය
**Title:** Ancient monastery complex in Ovagiriya
**Keywords:** Ovagiriya, Rajarata history, Rohana history